**ගොවිජන සංවර්ධන අරමුදල -2021**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

ගොවිජන සංවර්ධන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ.

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 32,000 ක් වූ ජලධාරා ඇල්බම් 08 ක ඌනතාවය, එකතු වටිනාකම රු. 34,560 ක් වූ ජලධාරා අත්පොත් 108 ක ඌනතාවය හා සමාලෝචිත වර්ෂයේ විකුණූ රු. 12,800 ක් වූ ජලධාරා අත්පොත් 40 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ජලධාරා ඇල්බම් සහ අත්පොත් වටිනාකම ගිණුම්වලින් අඩු නොකිරීම හේතුවෙන් තොග ශේෂය රු. 79,360 ක් වැඩියෙන් දැක්වුණි. | ජලධාරා ඇල්බම් සහ ජලධාරා අත්පොත් පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොවීම හේතුවෙන් මෙම ඌනතාවය හටගෙන ඇති අතර 2022 වර්ෂයේදි නිවැරදි ශේෂයන් ඇතුළත් කොට මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදු කරන බවට දන්වා සිටිමි. | ජලධාරා ඇල්බම් සහ ජලධාරා අත්පොත් ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන්ට අදාළව ලැබුණු රු. 5,531,514 ක රෝද 02 ට්‍රැක්ටර් වාරික ආදායම හා රු. 18,500 ක ජල පොම්ප වාරික ආදායම සමුච්චිත අරමුදලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 5,550,014 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂය තුළදී පෙර වර්ෂ වලට අදාළව ලැබෙන ට්‍රැක්ටර් වාරික සහ ජල පොම්ප වාරික ආදායම් සමුච්චිත අරමුදලට බැර කරනු ලැබුවහොත් අදාළ වර්ෂයේ වියදම් සිදු කිරීමේ දී ගැටලු පැන නගින බැවින් සමාලෝචිත වර්ෂයට අදාළව ලැබුණු ට්‍රැක්ටර් වාරික සහ ජල පොම්ප වාරික ආදායම්, සමුච්චිත අරමුදලට බැර නොකර වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කරන ලදී. | පෙර වර්ෂවලට අදාළ ආදායම සමුච්චිත අරමුදලට බැර කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් ලැබිය යුතු සියයට 20 ක අක්කර බදු ආදායම් රු. 13,274,077 ක් මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | වර්ෂයට අදාළව ලැබිය යුතු සියයට 20 ක අක්කර බදු ආදායම මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දින වන විට ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් 2021 වර්ෂයට අදාළව කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට සහ කුඹුරු ඉඩමක් නොවන බව සහතික ලබාදීමට අය කළ අවසරපත්‍ර ගාස්තු ලැබුණු ආදායමෙන් ගොවිජන සංවර්ධන අරමුදලට ලැබිය යුතු සියයට 40 ක් වන රු. 1,549,148 ක් සහ 2021 ට පෙර වර්ෂයන්ට අදාළව ලැබිය යුතු රු. 3,911,914 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2021 ට පෙර වර්ෂයන්ට අදාළව ලැබිය යුතු රු. 3,911,914 ක වටිනාකම ගණනය කිරීම 2021 දෙසැම්බර් 31 දින වන විට සිදුකර නොතිබූ අතර එය 2022 මාර්තු 31 දින වන විට සම්පූර්ණ කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදුකරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | වර්ෂයට අදාළ සහ පෙර වර්ෂවල ලැබිය යුතු ආදායම් නිසිපරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතුය. |
| (ඉ) | 2020 ගිණුම් වර්ෂයට අදාළව විගණන වාර්තාවේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ පෙන්වා දුන් පරිදි 2019 දෙසැම්බර් 31 දිනට රෝද 02 ට්‍රැක්ටර් ණයගැතියෝ රු. 2,551,196 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. එම තත්ත්වය හේතුවෙන් රෝද 02 ට්‍රැක්ටර් ණයගැති ශේෂය හා උපලබ්ධි නොවූ වාරික ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | නිවැරදි ණයගැතියන් මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුය. |

1.5.2 **පැහැදිලි නොකළ වෙනස්කම්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව 2KR ව්‍යාපෘති ජල පොම්ප ණයගැති ශේෂය රු. 2,468,003 ක් වුවත් ණයගැති උපලේඛන අනුව ශේෂය රු. 2,507,003 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල ජල පොම්ප ණයගැති ශේෂය හා උපලබ්ධි නොවූ ජල පොම්ප වාරික ගිණුමේ ශේෂය රු. 39,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අදාළ උපලේඛන සමඟ සැසඳීම් කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ පොත් අනුව පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 290,216,591 ක් වුවද, භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු. 290,862,305 ක් විය. ඒ අනුව දීර්ඝ කාලයක සිට පැවත එන රු. 645,714 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙනස තුළ ඇතුළත් රු. 6,433 ක මුදල 2022 පෙබරවාරි 23 දින නිවැරදි කර ඇත. රු. 651,797 ක වෙනස පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා පත් කර ඇති කමිටුව වෙනසට බලපෑ ගනුදෙනු හඳුනාගෙන නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සුදුසු බවට යෝජනා කර ඇත. නමුත් ඊට අදාල ලිපිලේඛන ඉතා පැරණි වීමත් එම ලිපිලේඛන සොයා ගැනීමට පවතින දැඩි දුෂ්කරතාවය සහ ඒ සඳහා විශාල කාලසීමාවක් ගතවීමත් හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු වී ඇත. | පොදු තැන්පත් ගිණුමේ පවත්නා වෙනස නොපමාව නිරවුල් කළ යුතුය. |

**1.6. ලැබිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි සංවිධාන වෙත 2010 වර්ෂයේදී ලබාදී තිබුණු රෝද 02 ට්‍රැක්ටර් ට්‍රේලර් හා රෝද 04 ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා වර්ෂ 09 ක කාලයක සිට අයවිය යුතු රු. 4,112,575 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020, 2021 වර්ෂවලදී මෙම හිඟ වාරික අයකරගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කර තිබුණද රට තුළ පැවති කොවිඩ් වාතාවරණය හේතුවෙන් සැලසුම් කළ පරිදි නිලධාරීන් ක්ෂේත්‍ර රාජකාරී සඳහා යෙදවීමට නොහැකි විය. ගොවීන්හට සිදු වී තිබූ ආර්ථික අපහසුතා මත ට්‍රැක්ටර් වාරික සහ ජල පොම්ප වාරික අය කර ගැනීමට අපහසු වූ බව දන්වා සිටිමි. කෙසේ වෙතත් 2022 වසරේදී හිඟ ආදායම් අය කර ගැනීමට වැඩසටහන් ආරම්භක මට්ටමින් ක්‍රියාත්මක වේ. | මෙම ණය ශේෂ නොපමාව අයකර ගත යුතුය. |
| (ආ) | ජපන් යෙන් ආධාර ව්‍යාපෘතිය යටතේ 2006, 2008, 2010 හා 2012 වර්ෂවල ලබාදී ඇති රෝද 02 ට්‍රැක්ටර් සඳහා අයවිය යුතු මුදල් 2015 වන විට අයකර ගත යුතු වුවත් රු. 116,413,886 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020, 2021 වර්ෂවලදී මෙම හිඟ වාරික අයකරගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කර තිබුණද රට තුළ පැවති කොවිඩ් වාතාවරණය හේතුවෙන් සැලසුම් කළ පරිදි නිලධාරීන් ක්ෂේත්‍ර රාජකාරී සඳහා යෙදවීමට නොහැකි විය. එමෙන්ම කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ගොවීන්හට සිදු වී තිබූ ආර්ථික අපහසුතා මත ට්‍රැක්ටර් වාරික සහ ජල පොම්ප වාරික අය කර ගැනීමට අපහසු වූ බව දන්වා සිටිමි. කෙසේ වෙතත් 2022 වසරේදී හිඟ ආදායම් අය කර ගැනීම පිළිබඳව වෙන් වෙන් වශයෙන් වැඩසටහන් සකස් කර ඇති අතර මේ වන විටත් එම වැඩසටහන් ආරම්භක මට්ටමින් ක්‍රියාත්මක වේ. | මෙම ණය ශේෂ නොපමාව අයකර ගත යුතුය. |
| (ඇ) | වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින රු. 2,468,003 ක 2KR ව්‍යාපෘතිය ජල පොම්ප ණයගැති ශේෂය හා රු. 19,617,600 ක රෝද 04 ට්‍රැක්ටර් ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | මෙම ණය ශේෂ නොපමාව අයකර ගත යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) | තත්කාර්ය අතුරු අග්‍රිමය නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට රු. 1,330,830 ක් වූ නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ අඩුපාඩු සම්පූර්ණ කර හැකි ඉක්මණින් අත්තිකාරම් පියවා අවසන් කරන ලෙස සියලු නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන් දැනුවත් කරන ලදි. ඒ අනුව රු. 1,075,830 ක අත්තිකාරම් මේ වන විටත් පියවා අවසන් කර ඇති අතර ඉතිරි රු. 255,000 ක අත්තිකාරම් මුදලද 2022 වර්ෂය තුළදී පියවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය අවසන් වී දින 10 ක් තුළ පියවා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,441,249 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.22,035,319 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු. 13,594,070 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අක්කර බදු අදායම රු. 9,832,305 කින් අඩුවීම, රෝද 02 ට්‍රැක්ටර් ආදායම රු. 2,109,974 කින් අඩුවීම හා මුළු වියදම් රු. 3,374,183 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂවල සිට පැවත එන රු. 450,000 ක තොග ඌනතාවයක් පෙන්නුම් කරනු ලබන අතර ඒ පිළිබඳව පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම වසර 10 කට වඩා ප්‍රමාද කර තිබුණි. | 1996 වර්ෂයේ සිට පැවත එන තොග ඌනතාවය පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා කමිටුවක් පත් කර ඇත. මේ පිළිබඳව විනය අංශය ද දැනුවත් කොට ඒ අනුව ඉදිරියේදී නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | පරීක්ෂණ කඩිනමින් සිදුකර අලාභ අය කරගත යුතුය. |
| (ආ) | කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට 2018 වර්ෂයේ අයදුම් කළ | 2018 වර්ෂයේ අයදුම් කළ 7/11/9/CO/2650 ගොනුවට අදාළව 2018 පෙබරවාරි 12 දින | අවශ්‍ය නිරවුල් කිරීම් අප්‍රමාදව කළ |

| | | |
|---|---|---|
| අයදුම්කරුවෙකුගෙන් රු. 912,000 ක ගාස්තුවක් ලබාගෙන තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයදුම්කරු වෙත අවසරපත්‍ර ලබාදීමට හෝ එම මුදල ආපසු ලබාදීමට කටයුතු කර නොතිබුණි. | රු. 912,000 ක සේවා ගාස්තුවක් ගෙවා ඇත. බලපත්‍රය නිකුත් කල යුතු දිනය වන විට බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම් වෙනත් කාර්යයක් සඳහා යෙදවීම අත්හිටුවා ඇති බැවින් බලපත්‍රය නිකුත් කර නොමැති අතර 2022 පෙබරවාරි 07 දිනැතිව කොළඹ දිස්ත්‍රික් සහකාර කොමසාරිස් වෙත දන්වා ඇත්තේ විෂයගත ඉඩම පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් සිදුකර ඉඩමෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව වාර්තාවක් කැඳවිය යුතු බවයි. මේ වන විට මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. | යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාතර දිස්ත්‍රික්කයේ තලල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ බොජුන්හල හා කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ බොජුන්හල ඉදිකිරීම සඳහා රු. මිලියන 10 ක් වෙන්කර තිබුණද සාර්ථක ටෙන්ඩර්කරු ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීම, නැවත කැඳවන ලද ටෙන්ඩරයට තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය නොලැබීම වැනි හේතූන් මත එම කාර්යයන් සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙත ටැබ් පරිගණක මිලදීගෙන සැපයීම සඳහා රු. මිලියන 25 ක් වෙන්කර තිබුණද අපේක්ෂිත අයුරින් දිස්ත්‍රික් මට්ටමින් අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා එම මුදල් උපයෝජනය කර ඩිජිටල්කරණ වැඩසටහන නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. | 2021 අයවැය මගින් එම යෝජිත මුදල වෙන්කොට තිබුණද, අපේක්ෂිත අයුරින් දිස්ත්‍රික් මට්ටමෙන් අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා ඩිජිටල්කරණ වැඩසටහන නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | -එම- |
| (ඇ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා නව ගිණුම්කරණ මෘදුකාංගයක් නිර්මාණය කිරීම සඳහා රු. මිලියන 2 ක් වෙන්කර තිබුණද රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවක් ලෙස දක්වමින් අදාළ කාර්යය සිදුකර නොතිබුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය මත 2021 වර්ෂය තුළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කරගැනීමට නොහැකි විය. 2022 වර්ෂයේ ඉදිරි කාලය තුළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සැලසුම් කළ කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අදාළ මෘදුකාංගය නිර්මාණය කිරීමටත් ක්‍රියාත්මක තත්වයට පත්කිරීමටත් සැලසුම් කර ඇති බව දන්වා සිටිමි. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ හා පසුගිය වර්ෂවලදී අරමුදලේ කර්තව්‍ය හා කාර්යයක් වූ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු කිසිවක් සිදුකර නොතිබුණු අතර 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින්ද ඒ සඳහා මුදල් වෙන්කර නොතිබුණි. | කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා මානව සම්පත අප සතුව නොමැති බැවින් ඉදිරි වර්ෂ වලදී ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. | පනතේ කර්තව්‍ය හා කාර්යයන් ඉටු කිරීමට ක්‍රියා කළ යුතුය. |

**4.1** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීමේ අරමුණින් කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය සම්බන්ධව දිස්ත්‍රික්ක 25 හි පුහුණු වැඩසටහන් පැවැත්වීමට රු. මිලියන 05 ක් වෙන්කර තිබුණද පැවති වසංගත තත්ත්වය හේතුවක් ලෙස දක්වමින් එම කාර්යය සිදු කර නොතිබුණි. | මුහුණ දීමට සිදු වූ කොවිඩ් වසංගත තත්ත්වය මත, අදාළ නිලධාරීන් සහභාගීත්වයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වුව ද, Zoom තාක්ෂණය භාවිතයෙන් කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය සම්බන්ධ දැනුම සහ තොරතුරු ලබා දීමට කටයුතු කළ බව පෙන්වා දෙමි. | අයවැය ලේඛනය මගින් වෙන් කළ මුදල් උපයෝජනය කළ යුතුය. |